# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2145/5 - 2019 ඔක්තෝබර් මස 14 වැනි සඳුදා - 2019.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2007

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත**

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇඅ) සහ 8(2) වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 24 වන වගන්තිය යටතේ ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**අජිත් පී. පෙරේරා,**
ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2019 අංක 1 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (ශ්‍රී ලංකා අනන්‍යතා අංකය) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2019 ඔක්තෝබර් 10 දින සිට බලාත්මක වන්නේ ය.

2. කොමසාරිස් ජනරාල්වරයා විසින්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සෑම උපතක්ම ලියාපදිංචි කිරීමෙන් පසුව සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුම සම්බන්ධයෙන් (මෙහි මින් මතු "ශ්‍රී ලංකා අනන්‍යතා අංකය (SLIN)" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා අනන්‍යතා අංකයක්, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ආකෘතියෙන් සහ ආකාරයෙන් නිර්මාණය කරනු ලැබිය යුතු ය.

3. කොමසාරිස් ජනරාල්වරයා විසින්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ සියලුම පුරවැසි පාදක ගනුදෙනු සඳහා ශ්‍රී ලංකා අනන්‍යතා අංකය (SLIN) ලබා දීම මගින් ශ්‍රී ලංකා අනන්‍යතා අංකය (SLIN) සුවිශේෂි හඳුනාගැනීමේ අංකය වශයෙන් භාවිතා කිරීම සඳහා අවසර ලබා දී පහසුකම් සලසනු ලැබිය යුතු ය.

4. කොමසාරිස් ජනරාල්වරයා විසින් නිර්මාණය කරනු ලබන ශ්‍රී ලංකා අනන්‍යතා අංකය (SLIN) සෑම රාජ්‍ය ආයතනයක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සියලුම පුරවැසි පාදක ගනුදෙනු සඳහා භාවිත කරනු ලැබිය යුතු ය.

5. මේ නියෝගවල -

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත් කරන ලද කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"රාජ්‍ය ආයතනය" යන්නට, යම් අමාත්‍යාංශයක්, යම් රජයේ දෙපාර්තමේන්තුවක්, යම් රාජ්‍ය සංස්ථාවක්, යම් පළාත් පාලන ආයතනයක්, රජය සතු යම් ව්‍යාපාරයක් හෝ වෙනත් ව්‍යවසායයක් සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ එසේ ලියාපදිංචි කරන ලද බවට සලකනු ලබන, එහි කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රතිශතයක් රජය, යම් රාජ්‍ය සංස්ථාවක් හෝ යම් පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන යම් සමාගමක් ඇතුළත් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියක් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආඥාවූව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන් (110 වන අධිකාරය වූ) උපත් සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත් කරන ලද රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා අදහස් වේ.

## උපලේඛනය

(2 වන නියෝගය)

| උපන් වර්ෂය | වර්ෂයේ උපන් දිනය | නිකුත් කළ දිනයේ අනුක්‍රමික අංකය | අංක පරීක්ෂා කරන්න | හැඳුනුම්පත් අනුවාදය |
|---|---|---|---|---|
| Yyyy | Ddd | Nnnn | C | A |

උදාහරණ :-

| | | | | | |
|---|---|---|---|---|---|
| පැරණි අංකය | 64 | 104 | 275 | 7 | V |
| අලුත් අංකය | 1964 | 104 | 0275 | 7 | |

11 - 16

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.